# අභිගුණ්ඨික චාරිත්‍රවාරිත්‍ර පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්
(තඹුත්තේගම, කුඩාගම ඇසුරින්)

යූ.එච්.ජී.කේ.එස්. රත්නායක

පුරාවිද්‍යා හා උරුම කළමණාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
uhgksrathnayaka@gmail.com

ප්‍රමුඛ පද: අභිගුණ්ඨික, චාරිත්‍රවාරිත්‍ර, වර්තමාන

## හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ විවිධ ජන කොටස් වාසය කරන අතර ඒ තුළ අභිගුණ්ඨික, වැදි, රොඩී, කාපිරි ආදී ගෝත්‍රික පිරිස් වේ. සංචාරක දිවි පෙවතක් ගත කරන මෙම පිරිස් ලංකාව, ඉන්දියාව ඇතුළු රටවල් ගණනාවක සිටිති. ජීවනෝපාය අනුව මද්දිලයන් සහ වඩිගයන් වශයෙන් කොටස් දෙකකි. ගෝත්‍රය තුළ දූගුදොරු හා තැපලොරු වශයෙන් ද කුල දෙකකි. සංචාරක දිවි පෙවතක් ගත කළ මොවුන් ප්‍රදේශ කිහිපයකම ස්ථිර පදිංචිකරුවන් වශයෙන් පදිංචි කළ අතර මෙම අධ්‍යයනයට ලක් කළ කුඩාගම ගම්මානයේ අභිකුණ්ඨිකයන් පදිංචි කරවා ඇත්තේ 1981 දී පමණ ය. ස්ථිර පදිංචි කරුවන් බවට පත් වීමෙන් අනතුරුව අභිගුණ්ඨික සාම්ප්‍රදායික වෘත්තීන් වලට අමතරව කෘෂිකාර්මික කටයුතු ආදියෙහි නිරත වීමට මොවුන්ට හැකියාව ලැබුණි.ඒ සමගම අභිගුණ්ඨික සංස්කෘතික චාරිත්‍රවාරිත්‍ර තුළ වෙනස් වීම් ඇති වී තිබේ.වර්තමානය වන විට ඔවුන්ගේ සාම්ප්‍රදායික සහ වත්මන් චාරිත්‍රවාරිත්‍ර අතර විශාල වෙනසක් පවතියි. අභිගුණ්ඨික චාරිත්‍රවාරිත්‍ර පිළිබඳ පැවසීමේ දී එය ගැටලුකාරී තත්වයකි.ඒ අනුව අභිගුණ්ඨික චාරිත්‍රවාරිත්‍ර වර්තමානය වන විට විපරිත වීම පර්යේෂණ ගැටලුව කර ගනිමින් ඔවුන්ගේ චාරිත්‍රවාරිත්‍ර වෙනස් වී ඇති ආකාරය පිළිබඳව විමසීම මෙයින් සිදු වේ.

## ක්‍රමවේදය

මේ පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ක්‍රමවේද කිහිපයක් යටතේ අධ්‍යයනය කිරීම සිදු විය. මූලික දත්ත රැස් කිරීම ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් සිදු විය. සම්මුඛ සාකච්ඡා පැවැත්වීම තුළින් තොරතුරු ලබා ගන්නා ලදි.

ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය මඟින් ද පුස්තකාල සමීක්ෂණය ඔස්සේ සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කිරීමෙන් තොරතුරු ලබා ගන්නා ලදි. මෙම පර්යේෂණ මාතෘකාව පුළුල් පරාසයක විහිදෙන අතර පර්යේෂණ ගැටළුවට අදාලව කරුණු සෙවීමේ දී තොරතුරු ලබා ගැනීම කුඩාගම අභිගුණ්ඨික ගම්මානයට පමණක් සීමා කොට සිදු විය.

## ප්‍රතිඵල හා සාකච්ජාව

අතීතයේ සිට පැවත එන සාම්ප්‍රදායික අභිගුණ්ඨික චාරිත්‍රවාරිත්‍ර තුළ ඔවුන්ටම ආවේණික වූ ලක්ෂණ ගැබ්ව පැවතුණි. උත්පත්තියේ සිට මරණය දක්වාම විවිධ අවස්ථා වැදගත් සිදුවීම් හා බද්ධ වූ චාරිත්‍ර වාරිත්‍ර තුළ ඔවුන්ගේ අනන්‍යතාව ගැබ්ව පැවතිණ. ඒ අතර උපත, වැඩිවියට පත් වීම, විවාහ, අවමංගල්‍ය සහ ආගමික චාරිත්‍රවාරිත්‍ර විශේෂයෙන් පෙන්වා දිය හැකිය.

උපත හා සම්බන්ධ සාම්ප්‍රදායික චාරිත්‍ර ගත් කළ දරුවා ලැබීමට ආසන්න

කාලයේ දී රුහේ වින්නඹු මාතාව සමඟ ඇය වෙනමම කුඩාරමක තැබීමට කටයුතු සලසයි. එවන් ආවතේව වලට විශේෂයෙන් ලක් කෙරෙනුයේ කුළුදුල් දරුවකු ලබන මව්වරුන් ය. ප්‍රසව වේදනාව ඇති වන දින වල දී අරක්කු මිශ්‍ර කළ කායම් හොද්ද දිනකට තුන් වරක් බීමට ලබා දෙයි. වර්තමානයේ දී දරු ප්‍රසූතියේ දී රෝහල හා සම්බන්ධ වන මොවුන් ප්‍රසූතියෙන් පසුව එම මවට දින තුනක් යන තුරු ගම්මිරිස් හොද්ද ආහාරයට ලබා දෙයි. දේශීය බෙහෙත් වට්ටෝරුවක් තම්බා මිරිකා ඉස්ම ගෙන දින තුනක් පමණ පානයට ලබා දෙයි.

වැඩිවියට පත් වීම හා සම්බන්ධ චාරිත්‍ර තුළ අතීතයේ දී මොවුන් නැකත් බැලීමක් සිදු නොකළ අතර මල්වර වූ දැරිය අලුත් කුඩාරමක් තනා එහි දින හතක් තබා හත් වන දිනයෙහි අළුයම ඇයව නහවා දෝෂ මැකීමේ චාරිත්‍රය සිදු කරයි. දින පහකට පසු බිත්තර බිඳ කුකුළෙකු කපා පසුව කිරි ගසකට ඇන තුවාල කරවා එම කිරි ඇයට දැකීමට සලසයි. නමුදු එම තත්වය වෙනස් වී වර්තමානයේ දී දැරියක මල්වර වීමෙන් අනතුරුව ඇය ජීවත් වන නිවසේම කාමරයක තබා නැකත් බලා ඒ අනුව ඇයව අදාළ සුබ දිනයෙහි කාමරයෙන් පිටතට ගෙන නෑවීම සිදු කරයි. නෑවීමෙන් අනතුරුව කිරි ගසක් තුවාල කරවා එයින් වැස්සෙන කිරි දර්ශනයට ඉඩ සලසයි. අභිකුණ්ඨික කතෝලික බැතිමතුන් මල්වර වූ දැරිය එක් දිනක් පමණක් කාමරයක තබයි.

මංගල්‍යය කටයුතු සම්බන්ධ අතීත චාරිත්‍රවාරිත්‍ර ගත් කල්හි නෑනා මස්සිනා විවාහය බහුලව සිදුවිය. මංගල උත්සවයක් දින හතක් පවතින අතර මංගල දිනයෙහි පෝරුවේ චාරිත්‍රය, තැලි පැලඳීමේ චාරිත්‍රය සිදු කරයි. දෑවැදි වශයෙන් නයෙක්, නයි පෙට්ටියක්, නලාවක්, බූරුවෙක් සහ බල්ලන් දෙදෙනෙකු ලබා දෙයි. වර්තමානයේ ද මංගල චාරිත්‍ර තුළ අඩු වයස් විවාහ සිදු වන අතර නෑනා මස්සිනා විවාහය යම්තාක් දුරට සිදු වේ. නමුදු තම රුචිය මත නෑනා මස්සිනා හෝ වෙනත් අයෙකු සමඟ විවාහය සිදු කර ගත හැකිය. මංගල්‍යයට පෙර ආරාධනා පත්‍ර ලබා දීම,මංගල්‍යය එක් දිනකට සීමා කිරීම පෝරුවේ චාරිත්‍ර, ආශිර්වාද ශ්ලෝක ගායනා කිරීම, මුදු මාරු කිරීම හා දෑවැදි දීම සිදු වේ. දෑවැදි වශයෙන් නිවසකට අවශ්‍ය භාණ්ඩ, රත්තරං භාණ්ඩ සහ දෙමාපියන්ට ඉඩ කඩම් තිබේ නම් ඒවා ද දෑවැදි වශයෙන් ලබා දෙති.

අතීත අවමංගල්‍යය චාරිත්‍ර තුළ යමෙකු මිය ගිය විට දේහය දින දෙකක් පමණ තබා ගැනීම සහ පසුව පසුව කැලයට ගෙන ගොස් දමයි. මිය ගොස් දින 21ක් ගිය පසු මිය ගිය තැනැත්තාට පිං අනුමෝදම් කොට දානයක් දෙනු ලබයි. වර්තමානයේ දී අවමංගල්‍ය චාරිත්‍ර ඔවුනොවුන් අදහන ආගම් අනුව සිදු කරති. බෞද්ධාගමේ අභිගුණ්ඨිකයන් මිය ගිය කල්හි දේහය දින තුනක් පමණ නිවසේ තබා ගැනීම, භික්ෂූන් වහන්සේලා වඩම්වා බණ දේශනා කොට හූමදානය කිරීම සිදු කිරීම කරති. මිය ගොස් දින 7න් මාස 3න් සහ අවුරුද්දෙන් බණ දේශනා කොට පිං අනුමෝදම් කරයි. කතෝලික අභිගුණ්ඨිකයන් අවමංගල්‍ය කටයුතු පල්ලිය හා සම්බන්ධ වී සිදු කරති.

අතීතයේ දී මොවුන්ට නිශ්චිත ආගමක් නොවුණි. ආගමික විශ්වාස වශයෙන් අතීතයේ පටන් ඇන්ගේටස් සාමි, කතම්ම සාමි, මසම්මා සල්ලපුරම්මා, කතරගම දේව වන්දනය සිදු කර ඇත. වර්තමානය වන විට කුඩාගම අභිගුණ්ඨික ජනයා ප්‍රධාන ආගම් දෙකක් වන බෞද්ධ ආගම සහ ක්‍රිස්තියානි ආගම වැළඳගෙන ඇත. බෞද්ධයන් පෝය දිනයන්හි පන්සල හා සම්බන්ධ වී සිල් සමාදන් වීමත් නියමිත දිනයෙහි පන්සල වෙත දානය ලබා දීමත් සිදු කරති. ක්‍රිස්තියානි පිරිස් පල්ලිය හා සම්බන්ධ වී ආගමික

කටයුතු කරති. පුල්ලෙයාර් දෙවියන්, සරස්වති දෙවියන් ,පත්තිනි අම්මා, කතරගම දෙවියන් වන්දනය අදටත් ඔවුන් අතර ප්‍රචලිත වේ.

ගෝත්‍රික ලක්ෂණ බහුල වශයෙන් පෙන්නුම් කළ අභිගුණ්ඨික ප්‍රජාවක් තුළින් මෙවන් ප්‍රවනතාවක් දැකගත හැකි වීම විශේෂත්වයකි. අතීතයේ පැවති අභිගුණ්ඨික චාරිත්‍රවාරිත්‍ර තුළ ප්‍රාථමික ලක්ෂණ වැඩි වශයෙන් පෙන්නුම් කළ ද එහි ඔවුනටම අනන්‍ය වූ සංස්කෘතියක් පැවතිණි. නමුදු වර්තමානය වන විට ඔවුන් සිය චාරිත්‍රවාරිත්‍ර සිදු කිරිමේ දී වෙනත් සංස්කෘතික ලක්ෂණයන් බද්ධ කරගනිමින් ඔවුන්ගේ සාම්ප්‍රදායික චාරිත්‍රවාරිත්‍ර නවීකරණයට ලක් කරගෙන ඇත.වත්මන් අභිගුණ්ඨික චාරිත්‍රවාරිත්‍ර සිංහල සංස්කෘතික චාරිත්‍රවාරිත්‍ර හා බෙහෙවින් සමානත්වයක් දරයි. මේ අනුව ගෝත්‍රික ලක්ෂණ පෙන්නුම් කළ අභිකුණ්ඨිකයන් මහා සමාජයේ චාරිත්‍රවාරිත්‍ර අනුගමනය කරමින් වෙනස් වීමට වෙර දරන බව කුඩාගම අභිගුණ්ඨික ජනයා තුළින් පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


රණසිංහ, චන්ද්‍රශ්‍රී (2003) ***ලොව පැතිර වසන අභිගුණ්ඨිකයෝ.*** එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

සෝමසුන්දර, දයානන්ද., බණ්ඩාර, මාදන හේරත් (2009) ***ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ජන සමාජ***, ඇස් ගොඩගේ සහ සහෝදරයේ, කොළඹ.